# හස්ත මුද්‍රාවන්හි පවතින සන්නිවේදනාර්ථ

අසිත මල්ලවආරච්චි
කැලණිය විශ්වවිද්‍යාලය
asithaprabhath@ymail.com

## සංක්ෂේපය

මුහුණ හා වෙනත් ඉරියව් චලනය කිරීම මඟින් අපට සුවිශේෂ අර්ථ පළ කිරීමේ හැකියාව පවතී. සතුට, කෝපය, වේදනාව, සරාගිකත්වය, කළකිරීම, ගැටලුකාරීබව, පුදුමය වැනි අවස්ථාවල සිය හැඟීම ප්‍රකාශයට පත් කරන්නේ වාචික මාධ්‍ය තරමටම වරෙක ඊටත් වඩා එම හැඟීම් සන්නිවේදනය කරන්නේ මුහුණෙන්, අතපයෙන් හා ශාරීරික ඉරියව් ඇසුරින්ය. ඒ අනුව අදහස් ප්‍රකාශ කිරීමෙහිලා අත, ඇඟිලි උපයෝගී කර ගැනීම ප්‍රධාන සන්නිවේදන ක්‍රමෝපායක් ලෙස දැක්විය හැක. අදහස් ප්‍රකාශ කිරීමෙහිලා අංග චලනය ප්‍රකාශන මාධ්‍යයක් වශයෙන් භාවිතා කිරීම අප මුද්‍රා සන්නිවේදනය (Gesture Communication) වශයෙන් හඳුන්වනු ලැබේ. සංකේතනික ලාංඡනයක් හෙවත් අභිනයක්, මුද්‍රාවක් ලෙස හැඳින්වේ. මේ අනුව අදහස් සන්නිවේදනයෙහිලා හස්ත මුද්‍රා භාවිතා කරන අතර එම භාවිත හස්ත මුද්‍රාවන්ගේ සන්නිවේදනාර්ථ පිළිබඳව අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණය මඟින් සිදු කරනු ලැබේ. ඒ අනුව මෙම පර්යේෂණයේදී අධ්‍යයන ගැටලුව වන්නේ සන්නිවේදනයෙහිලා භාවිත කරනු ලබන හස්ත මුද්‍රාවන්ගෙන් මතු කරනු ලබන සන්නිවේදනාර්ථ මොනවාද? යන්නයි. එහි උපන්‍යාසය වන්නේ ප්‍රකාශනය කළ යුතු හැඟීම් වචන භාවිතයෙන් තොරව නිවැරදිව හස්ත මුද්‍රා තුළින් සන්නිවේදනය කිරමට ශක්තිමත් සන්නිවේදනාර්ථ මුද්‍රා සතුව පවතින බවයි. මෙම පර්යේෂණය කරගෙන යෑමේදී දත්ත රැස්කිරීම සඳහා පුස්තකාල පොත් , පුවත්පත්, සඟරා, මෙන්ම අන්තර්ජාල ප්‍රකාශනයන් ආදිය අධ්‍යයනය කරනු ලබන අතර විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් 50 ක් ඇසුරින් හඳුනාගත් හස්ත මුද්‍රා 10ක් පිළිබඳව සම්මුඛ සාකච්ඡා ඇසුරින් සන්නිවේදනාර්ථ මතු කරන ආකාරය අධ්‍යයනය කළෙමි. එමෙන්ම ඒ ඒ වෘත්තියමය ක්ෂේත්‍රය අනුව හස්ත මුද්‍රා තුළින් අදහස් කරනු ලබන අර්ථ මොනවාදැයි අධ්‍යයනය කරනු ලැබේ. ඒ අනුව රැස්කරන ලද දත්ත ගුණාත්මකව අන්තර්ගත විශ්ලේෂණයට ලක් කොට උපන්‍යාසයේ සත්‍ය අසත්‍ය බව සත්‍යාක්ෂණය කරනු ලැබේ. මෙම පර්යේෂණයෙන් එළඹිය හැකි නිගමන වන්නේ ඒ ඒ හස්ත මුද්‍රාවට ආවේණික සන්නිවේදනාර්ථ පැවතෙන නමුත් එකම මුද්‍රාවට අර්ථ කිහිපයක් පැවතිය හැකි බවය. ඒ හේතුවෙන් ග්‍රාහකයාට අර්ථ බාධක නිසා සන්නිවේදනය කරනු ලබන ඇතැම් දේ නිවැරදිව ග්‍රාහකගත නොවන බවයි. අනෙක් අතට ඇතැම් මුද්‍රාවන් තුළ අන්තර් සංස්කෘතික ලක්ෂණ පවතින අතර එයද අර්ථ බාධක මතු කිරීමට හේතු වන බව ප්‍රත්‍යක්ෂ විය.

*ප්‍රමුඛ පද:* මුද්‍රා, සන්නිවේදනය, සන්නිවේදනාර්ථ